සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

| | |
|---|---|
| නැටුම් (දේශීය) **I,II** | **පැය තුනයි** |
| நடனம் (சுதேச) **I,II** | மூன்று மணித்தியாலம் |
| **Dancing (Oriental) I,II** | *Three hours* |

## නැටුම් (දේශීය) I

විශේෂ උපදෙස් :

* සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **25** ට ම උත්තර සැපයිය යුතු ය. එයට අමතර ව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි උත්තර පත්‍රයේ පැහැදිලි ව ලියා දැක්විය යුතු ය.

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

### I කොටස

* අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස් තැන්වලට සුදුසු වචන තෝරන්න.

1. පා සරඹ අභ්‍යාස කිරීමේ දී යොදා ගන්නා සන වාද්‍ය භාණ්ඩය.............................. නම් වේ.
(1) ගැට බෙරය (2) පන්තේරුව (3) තාලම්පට (4) උඩැක්කිය

2. "රන් විලි දෙකොනට සොඳින් තබන්නේ" මෙම කවි පදය අයත් වන්නේ.............................. නැටුමටයි.
(1) ගොයම් (2) ලී කෙළි (3) කුලු (4) මෝල්ගස්

3. ලය ප්‍රභේද අනුව නර්තනයේ දී ඉතා අඩු වේගය .............................. ලෙස හැඳින්වේ.
(1) විලම්භ (2) අතිද්‍රැත (3) මධ්‍ය (4) ද්‍රැත

4. දෙසුළු මහ තුන්තිතට අයත් තාල රූපය, මාත්‍රා .............................. වේ.
(1) 2 + 2 + 3 (2) 2 + 2 + 4 (3) 2 + 3 + 4 (4) 2 + 4 + 2

5. ග්‍රහ පන්ති සහ ඇඹුම් කවි .............................. ශාන්තිකර්මයට අයත් වේ.
(1) කොහොඹා කංකාරි (2) දෙවොල් මඩුව (3) සන්නියකුම (4) බලි

6. "කඳවුරු සිරිත සහ සද්ධර්ම රත්නාවලිය" කෘති .............................. යුගයේ නර්තන කලාව පිළිබඳ මූලාශ්‍රය වේ.
(1) මහනුවර (2) කෝට්ටේ (3) දඹදෙණි (4) ගම්පළ

7. "පූර්ව රංගය සහ අපර රංගය" යනුවෙන් .............................. නාටකය කොටස් දෙකකට බෙදේ
(1) සොකරි (2) කෝලම් (3) නාඩගම් (4) නූර්ති

8. ලී දැතට ගෙන කනුවක් වටේ රටා මවමින් නටන ද්‍රවිඩ ගැමි නැටුම .............................. වේ.
(1) කෝලාට්ටම් (2) කාවඩි (3) පින්නල් කෝලාට්ටම් (4) කරගම්

9. තාල තැබීමේ දී තාලස්ථාන දැක්වීම .............................. නම් වේ.
(1) අනාඝාත (2) ආඝාත (3) ආතත (4) විතත

10. බෙරපද කවිපද ආදියට අදාළ තාල ලියා දැක්වීම .............................. යි.
(1) ප්‍රස්තාරකරණය (2) ප්‍රශ්නකරණය (3) ප්‍රකාශකරණය (4) වාර්තාකරණය

11. පිළිවෙළින් ඉලංගම් සරඹ සහ ගොඩ සරඹ අවසානයේ නටනුයේ,
(1) කස්තිරම සහ සීරුමාරුවයි. (2) ඉරට්ටිය සහ අඩව්වයි
(3) කස්තිරම සහ ඉරට්ටියයි. (4) ඉරට්ටිය සහ කස්තිරමයි.

12. 'ශෝක' නම් ස්ථායි භාවයෙන් උපදින රසය වන්නේ,
(1) ශෘංගාර රසයයි. (2) කරුණා රසයයි. (3) වීර රසයයි. (4) හාස්‍ය රසයයි.

[ දෙවැනි පිටුව බලන්න.

13. පිළිවෙළින් සබරගමු නර්තන සහ උඩරට නර්තන සම්ප්‍රදායන්ට අයත් නාට්‍යමය පෙළපාළි වන්නේ,
(1) ගුරුගේ මාලාව හා අසුර යක්කමයි. (2) අඹවිදමන හා අසුර යක්කමයි.
(3) වැදි යක්කම හා ගුරුගේ මාලාවයි. (4) අසුර යක්කම හා ගුරුගේ මාලාවයි.

14. ආඝාතාත්මක, අනාඝාතාත්මක යන ලක්ෂණ දෙක ම එකවර යෙදෙන ගායන විශේෂය,
(1) කරත්ත කවි වේ. (2) ටීකා වේ. (3) හටන් කවි වේ. (4) පාරු කවි වේ.

15. හණ නූලෙන් සකසා, පවන් සැලීමට යොදා ගත් රාජ සභා මෙවලමකි.
(1) අවාන (2) සේසත (3) චාමර (4) සේලය

16. "බඹවිමනෙව් දිසි දළඳා මැඳුරත" ............. මෙම ගායනය
(1) හටන් කවියකි. (2) ශ්ලෝකයකි. (3) නමස්කාරයකි. (4) ටීකාවකි.


17. රජු ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බවට ඓතිහාසික තොරතුරු හමුවන්නේ,
(1) අනුරාධපුර යුගයේ දී ය. (2) කෝට්ටේ යුගයේ දී ය.
(3) පොළොන්නරු යුගයේ දී ය. (4) දඹදෙණි යුගයේ දී ය.

18. කොහොඹා කංකාරියට සහභාගි වන ප්‍රධාන ඇදුරන් හඳුන්වන්නේ,
(1) ආතුරයන් නමිනි. (2) යක් දෙස්සන් නමිනි. (3) අතෝරකරුවන් නමිනි. (4) කොට්ටෝරුවන් නමිනි.

19. නර්තනයේ අවකාශය හා රිද්මය මෙන් චිත්‍රකලාවේ දී අවශ්‍ය වන්නේ,
(1) වර්ණ හා හැඩතල ය. (2) වර්ණ හා දිශාව ය. (3) දිශාව හා හැඩතල ය (4) රේඛාව හා දිශාව ය.

20. "ඉඳ ගත්තෙමි උස පුටුවක ගුවනා"
බැඳ ගත්තෙමි ජය කොණ්ඩය මුදුනා" මෙය,
(1) ගොයම් කවියකි. (2) රබන් කවියකි. (3) ඔන්චිලිවාරම් කවියකි. (4) ඔලිඳ කෙළි කවියකි.

21.



A




B

පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයට අනුව ඉහත දැක්වෙන රූප පෙළෙහි **A** හා **B** රූප අයත් වන්නේ කුමන වර්ගයට ද?
(1) ආතත හා විතත (2) විතත හා ආතත (3) විතත හා ඝන (4) ඝන සහ ආතත

22. එස්. පණීභාරත සහ ඒ. ඉඹුල්ගොඩ විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය ලෙස සැලකෙන්නේ,
(1) තිත්තබත හා රන්දද ය. (2) කරදිය හා රන්දද ය.
(3) තිත්තබත හා කරදිය ය. (4) නලදමයන්ති හා ග්‍රහ අපලය ය.

23. පහත සඳහන් ඡායාරූපයෙහි දැක්වෙන්නේ,



(1) නාගරාක්ෂ මුහුණයි.
(2) ගුරුළුරාක්ෂ මුහුණයි.
(3) නාග කන්‍යා මුහුණයි.
(4) ගරා වෙස් මුහුණයි.

- ප්‍රශ්න අංක **24** සහ **25** ට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් වගුව උපයෝගී කර ගන්න.

| පේළි | 1 තීරුව | 2 තීරුව | 3 තීරුව | 4 තීරුව |
|---|---|---|---|---|
| A | පුංග් | චෙන්ඩා | තබ්ලාව | මෘදංගය |
| B | ධෘපට්ටා | උච්චිපට්ටම් | කිරීටම් | පොෂ්වාන් |
| C | පදම් | පරන් | රාස්ලීලා | තෝඩායම් |

24. පිළිවෙළින් භරත, කථක්, කථකලි, මණිපුරි නර්තන සම්ප්‍රදායන්ට අයත් වාද්‍ය භාණ්ඩ සඳහන් වන්නේ,
(1) A පේළියේ 1, 2, 3, 4 තීරුවල ය. (2) A පේළියේ 2, 3, 4, 1 තීරුවල ය.
(3) A පේළියේ 4, 3, 2, 1 තීරුවල ය. (4) A පේළියේ 3, 2, 4, 1, තීරුවල ය.

25. කථක් සහ මණිපුරි නර්තන සම්ප්‍රදායට අයත් අංග සඳහන් වන්නේ,
(1) C පේළියේ 1, 2 තීරුවල ය. (2) C පේළියේ 2, 3 තීරුවල ය.
(3) B පේළියේ 1, 3 තීරුවල ය. (4) A පේළියේ 3, 4 තීරුවල ය.

## II කොටස - උඩරට නර්තනය

මාත්‍රා 2 + 3 තිත් රූපයට අයත් බෙර පදයකි.
(1) දොං දොං ජිං ජිං ගජිගත (2) දොං ජිංත ගත දොංත
(3) දොං ජිජි ගත (4) දොං ජිං ජිං ජිකු තක

"තෙයි ති තා තෙයි" යනු,
(1) පළමුවන පා සරඹයයි. (2) හයවන පා සරඹයයි. (3) පස්වන පා සරඹයයි. (4) දෙවන පා සරඹයයි.

සිංහරාජ වන්නම අයත් තිත්රූපය වන්නේ,
(1) මාත්‍රා 2 + 3 ට ය. (2) මාත්‍රා 3 + 4 ට ය. (3) මාත්‍රා 2 + 4 ට ය. (4) මාත්‍රා 4 + 4 ට ය.

ගැටබෙර කඳෙහි දිග ප්‍රමාණය වනුයේ,
(1) තුන් වියත් තුනඟුලකි. (2) තුන් වියතකි. (3) තුන් වියත් දෑඟුලකි. (4) එක් වියත් තුනඟුලකි

හත්පදයට අයත් නර්තනාංගයකි.
(1) දළුමුර පදය (2) තැඹිලි පදය (3) කොතල පදය (4) හමාර පදය

උඩරට නර්තනයේ ප්‍රධාන ඇඳුම් කට්ටලය ලෙස හඳුන්වන්නේ,
(1) තනි කච්චියයි. (2) වෙස් ඇඳුම් කට්ටලයයි. (3) නෛයඩි ඇඳුම් කට්ටලයයි. (4) බෙර ඇඳුම් කට්ටලයයි.

කොහොඹා කංකාරියේ එන ගායනා සහිත නර්තන අංගයකි.
(1) යක් ඇනුම (2) හත්පදය (3) යක් තුන්පදය (4) මඩුපුරය

උඩරට නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් කළ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි.
(1) එස්. පණීභාරත (2) කේ. එස්. ප්‍රනාන්දු (3) සචිරිස් සිල්වා (4) රද්දැල්ලේ පොඩිමහත්තයා

කොහොඹා කංකාරියේ දී පුදලබන ප්‍රධාන දෙවියකු වන්නේ,
(1) කඩවර දෙවියන් ය. (2) ඉරුගල් බණ්ඩාර දෙවියන් ය.
(3) වීදිය බණ්ඩාර දෙවියන් ය. (4) වැදි දෙවියන් ය.

"තත් තකට තක රොං ........ තක රොං" යන්නෙහි හිස් තැනට ගැළපෙන පදය තෝරන්න.
(1) තක්කඩ කුඳ කුඳ (2) තත් තත් කඩ කඩ (3) තරිකිට කිටිතක (4) තක්කඩ තක්කඩ කුඳ

දොං ජිං ජිං ............. මෙහි ඉතිරි පද කොටස් වන්නේ,
(1) ගත තරිකිට (2) දොං ජිං ජිං (3) තකට දොං තක (4) ජිං තරිකිට

උඩරට වන්නම් දහඅටට අයත් වන්නමකි.
(1) අනිලා (2) ගජබා (3) සිංහනාඩි (4) සිංහරාජ

කොහොඹා කංකාරියට පමණක් අයත්වන චාරිත්‍ර විධියකි.
(1) කප් සිටුවීම (2) මිල්ල කැපීම (3) හගලේ යැදීම (4) මඩුපේ කිරීම

මාත්‍රා තුනේ තනිතිතට අයත් වට්ටම වන්නේ,
(1) කුඳ කුජිගත (2) දොං ජිංත ගත දොංත (3) ගොග් ගොග් ජිං ජිං ගත (4) කුඳාංත ගත දොම්

උඩරට නර්තනයට ආවේණික වූ රංග වස්ත්‍රාභරණයකි.
(1) කාඟුල් (2) අවුල්හැරය (3) නළල්පට (4) රහු

## III කොටස - පහතරට නර්තනය

මාත්‍රා 2 + 3 තිත් රූපයට අයත් බෙර පදයකි.
(1) ගුංද දෙගත ගති ගත ගුඳ (2) ගුං දෙගත ගත්ත ගුං
(3) ගුඳ ගතිගත ගුඳ ගතිගත (4) ගුන්ද ගතිගත ගත්ත ගතිගුඳ

"තෙයිකිට තෙයිතාම් // තෙයිකිට /// තෙයි දොම් යනු,
(1) තුන්වන පා සරඹයයි. (2) හත්වන ඉලංගම් සරඹයයි. (3) පස්වන පා සරඹයයි. (4) හතරවන ඉලංගම් සරඹයයි.

හනුමන්තා තාලය සින්දු වන්නම අයත් තිත් රූපය වන්නේ,
(1) මාත්‍රා 2 + 3 යි. (2) මාත්‍රා 3 + 3 යි. (3) මාත්‍රා 2 + 4 යි. (4) මාත්‍රා 4 + 4 යි.

පහතරට බෙර කඳෙහි දිග ප්‍රමාණය වන්නේ,
(1) තුන් වියත් තුනඟුලකි. (2) තුන් වියතකි. (3) තුන් වියත් දෑඟුලකි. (4) එක් වියත් තුනඟුලකි.

හත් පදයට අයත් නර්තනාංගයකි.
(1) බුලත් පාළිය (2) යහන්මුට්ටි පදය (3) කෙණ්ඩි පාළිය (4) සළු පදය

පහතරට නර්තනයේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ,
(1) නානුමුර ඇඳුම් කට්ටලයයි. (2) තෙල්මේ ඇඳුම් කට්ටලයයි.
(3) බලි ඇඳුම් කට්ටලයයි. (4) බෙර ඇඳුම් කට්ටලයයි.

දෙවොල්මඩු ශාන්තිකර්මයේ ගායනය සහිත නර්තන අංගයකි.
(1) වඩිග පටුන (2) කළු යකා (3) ලිච්ඡවි (4) දෙවොල් නැටීම

[ හතරවැනි පිටුව බලන්න.

නි පිටුව බලන්න.

71814

33. පහතරට නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් කළ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි.
(1) කේ. එස්. ප්‍රනාන්දු (2) ආර්. ජී. පොඩිමහත්තයා (3) එන්. සිරිබෝහාමි (4) එස්. පණීභාරත

34. දෙවොල්මඩු ශාන්තිකර්මයේ දී පුදලබන ප්‍රධාන දෙවියකු වන්නේ,
(1) කුරුම්බර දෙවියන් ය. (2) පත්තිනි දෙවියන් ය. (3) බණ්ඩාර දෙවියන් ය. (4) කොහොඹා දෙවියන් ය.

35. "රිං ගතම් ........ ගදිත ගුං" යන්නෙහි හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.
(1) දැහිංත ගතම් ගතගත (2) දොම් දොම් ගදිගත (3) ගහිතිගතම් ගුහිතිගතම් (4) ගති ගතම් ගත්ත ගත

36. "ගුං දිතගත ගතිගත ගතිගත ........... " මෙහි ඉතිරි පද කොටස වන්නේ,
(1) දිත් දිතගත ගුං ගුං දිතගත (2) දොං ගජිගත ගුඳ ගතිගත
(3) ගත් දිතගත ගදි ගත ගතිගත (4) කුඳ ගජිගත කුඳ කුජිගත

37. පහතරට සින්දු වන්නම් තිස් දෙකට අයත් වන්නමකි.
(1) කදම්භපක්ෂි (2) අනිලා (3) කවිමිණි තාලය (4) අනුරාග දණ්ඩ තාලය

38. දෙවොල් මඩුවට අයත් චාරිත්‍ර විධියකි.
(1) වැදි යකුන් නැටීම (2) හගලේ යැදීම (3) මිල්ල කැපීම (4) අයිලේ යැදීම

39. "ගුඳ ගතිගත" වට්ටමට අයත් තිත්රූපය වනුයේ,
(1) මාත්‍රා 2 තනිතිත ය. (2) මාත්‍රා 2 + 3 දෙතිත ය. (3) මාත්‍රා 3 තනිතිත ය. (4) මාත්‍රා 3 + 4 දෙතිත ය.

40. පහතරට නර්තනයට ආවේණික වූ රංග වස්ත්‍රාභරණයකි.
(1) ශිඛාබන්ධනය (2) කාගුල් (3) පායිම්පත (4) උල්ලඩය

## IV කොටස - සබරගමු නර්තනය

26. මාත්‍රා 2 + 3 තිත්රූපයට අයත් බෙර පදයකි.
(1) ජිමිත කුඳා දොං (2) ජිං ජිමිත තත් තකට
(3) ජිමිත් තක්කිට තකට ජිමිතකු (4) ජිං ජිං තත් තත් කරතක

27. "තෙයි ගත කුඳ තෙයි තකට" යනු,
(1) පළමුවන දොඹින පදයයි (2) දෙවන දොඹින පදයයි
(3) පස්වන දොඹින පදයයි (4) හයවන දොඹින පදයයි

28. විරාඩි වන්නම අයත් තිත්රූපය වන්නේ,
(1) මාත්‍රා 2 + 3 ය. (2) මාත්‍රා 2 + 4 ය. (3) මාත්‍රා 3 + 4 ය. (4) මාත්‍රා 4 + 4 ය.

29. බෙර තට්ටුව සකසා ගැනීම සඳහා යොදා ගන්නා හම් වර්ගය වන්නේ,
(1) එළු හම් සහ හරක් හම් (2) වඳුරු හම් සහ හරක් හම් (3) වඳුරු හම් සහ එළු හම් (4) එළු හම් සහ හා හම්

30. හත් පදයට අයත් නර්තනාංගයකි.
(1) මුදුන් තාලය (2) මල් පදය (3) කෙණ්ඩි පාළිය (4) කොතල පදය

31. සබරගමු නර්තනයේ ප්‍රධාන ඇඳුම් කට්ටලය ලෙස හඳුන්වන්නේ,
(1) ශුද්ධ මාත්‍රා කට්ටලය ය. (2) පබළු ඇඳුම් කට්ටලය ය.
(3) බෙර ඇඳුම් කට්ටලය ය. (4) බලි ඇඳුම් කට්ටලය ය.

32. පහන් මඩුවට අයත් ගායනා සහිත නර්තන අංගයකි.
(1) මුදුන් තාලය (2) දේව කෝල්පාඩුව (3) යහන් දැක්ම (4) දෙවොල් නැටීම

33. සබරගමු නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවාවක් කළ ප්‍රවීණ ශිල්පියෙකි.
(1) රද්දැල්ලේ පොඩිමහත්තයා (2) කේ. එස්. ප්‍රනාන්දු මහතා
(3) එස්. පණීභාරත මහතා (4) සචිරිස් සිල්වා මහතා

34. පහන් මඩුවේ දී පුද ලබන ප්‍රධාන දෙවියකු වන්නේ,
(1) බණ්ඩාර හත් කට්ටුව ය. (2) පත්තිනි දෙවියන් ය. (3) කොහොඹා දෙවියන් ය. (4) කඩවර දෙවියන් ය.

35. "තත් තරිගු ..... ජෙ ජෙ කිනං තකට" යන්නෙහි හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.
(1) ජිත් කුඳත් ගත කුඳත් (2) තෙහි තෙහිංත (3) ජිං ජිමිත තක (4) තත් තකට

36. "ජිමිත් තක්කිට ............................" මෙහි ඉතිරි පද කොටස වන්නේ,
(1) දොංත තා ය. (2) දොං තා ය. (3) තකට ජිමිතකු ය. (4) තක්කිට තිමිතක ය.

37. සබරගමු සම්ප්‍රදායට අයත් වන්නමකි.
(1) සමනල වන්නම (2) හංස වන්නම (3) අසදෘස වන්නම (4) අනිලා වන්නම

38. පහන් මඩුවට අයත් චාරිත්‍ර විධියකි.
(1) වැදි යකුන් නැටීම (2) හගලේ යැදීම (3) මිල්ල කැපීම (4) අයිලේ යැදීම

39. ගමන් මාත්‍රයට අදාළ තිත්රූපය,
(1) මාත්‍රා 3 + 3 ය. (2) මාත්‍රා 3 + 4 ය. (3) මාත්‍රා 4 + 4 ය. (4) මාත්‍රා 2 + 4 ය.

40. සබරගමු නර්තන සම්ප්‍රදායට ආවේණික රංග වස්ත්‍රාභරණයකි.
(1) උරබාහු (2) නෙත්ති මාලය (3) බුබුළු පටිය (4) අවුල්හැරය

* *

[ පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

නැටුම් (දේශීය) I,II
நடனம் (சுதேச) I,II
Dancing (Oriental) I,II

## නැටුම් (දේශීය) II

※ **පළමු වන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
※ **පළමු වන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොද ඉදිරියෙන් ලියන්න.**

(i) උඩරට නර්තනයේ දී ගොඩ සරඹ මෙන් සබරගමු නර්තනයේ දී ........................... නටනු ලබයි.

(ii) අ.පො.ස. (සා.පෙළ) විෂයමාලාවට නැටුම් විෂයය එක්වූයේ ........................... වර්ෂයේ දී ය.

(iii) **යගන් දැක්ම** පහතරට මෙන් ම ........................... නර්තන සම්ප්‍රදායේ ද එන ශාස්ත්‍රීය නර්තන අංගයකි.

(iv) මණිපුරි නර්තනයේ කාන්තා හිස්පළඳනාව ........................... නමින් හැඳින්වේ.

(v) ගිරිදේවි නර්තනය අයත් වන්නේ ........................... නැටුම් සම්ප්‍රදායට ය.

(vi) සිසී සහ මණ්ණඩිරාළ ........................... මුද්‍රා නාට්‍යයේ එන චරිත වේ.

(vii) බටහිර මුද්‍රා නාට්‍යය සඳහා ප්‍රධාන වාද්‍යය භාණ්ඩය ලෙස ........................... භාවිත කරයි.

(viii) 'එඩක්ක' නම් වාද්‍ය භාණ්ඩය .................. නර්තනය සඳහා යොදා ගනී.

(xi) රසභාව පිළිබඳ විස්තර වන භාරතීය කෘති **දෙකක්** නම්,

(අ) භරතමුනිවරයා රචනා කළ ...........................................

(ආ) නන්දිකේශ්වරයන් රචනා කළ ...........................................

(x) සතර අභිනයේ දී වේදිකා සැරසිලි .................. නමින් ද ගීත ගායනා .................. නමින් ද හැඳින්වේ.

**2.** (i) මාත්‍රා 3 + 4 තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාරගත කරන්න.

(ii) මාත්‍රා 2 + 3 තිතට අයත් වන්නමක/සින්දු වන්නමක කවි පදයක් ප්‍රස්තාරගත කරන්න.

(iii) මාත්‍රා 4 + 4 තිතට අයත් වන්නමක අඩව්වක් ප්‍රස්තාරගත කරන්න.

**3.** කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව සහ පහන් මඩුව ප්‍රධාන දේශීය ශාන්තිකර්ම ලෙස හැඳින්වේ.

(i) කොහොඹා කංකාරිය ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු **දෙකක්** ලියා දක්වන්න.

(ii) ඉහත ශාන්තිකර්ම අතුරෙන් **එකක**, පූර්ව චාරිත්‍ර පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.

(iii) අස්නේ, තෙල්මේ සහ මල්පද යන නර්තන අංග අතුරෙන් **එකක්** පිළිබඳ ව විග්‍රහයක් කරන්න.

**4.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) බුම්මැඩිය (ii) තාලානුකූල චලන
(iii) ප්‍රශස්ති (iv) යක්කම්
(v) සමග්‍රහ

**5.** (i) අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ දැක්වෙන ලිඛිත මූලාශ්‍රය **දෙකක්** නම් කරන්න.

(ii) නර්තන කලාව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට, දඹදෙණි යුගය ඇසුරෙන් **සාධකයක්** ඉදිරිපත් කරන්න.

(iii) ගම්පොළ යුගයේ නර්තන කලාව පිළිබඳ ව ඓතිහාසික සාධක **දෙකක්** විග්‍රහ කරන්න.


The National e-learning Portal for The General Education

[ හයවැනි පිටුව බලන්න.

6.



A



B

(i) **A** හා **B** ඡායාරූපවලින් දැක්වෙන නර්තන සම්ප්‍රදායන් නම් කර, ඉන් එක් සම්ප්‍රදායක් ප්‍රචලිත රටවල් **දෙකක්** ලියන්න.

(ii) එම සම්ප්‍රදායන්ට අදාළ සංගීත සම්ප්‍රදායන් **දෙක** විස්තර කරන්න.

(iii) ඉහත සඳහන් නර්තන සම්ප්‍රදායක රංග වස්ත්‍රාභරණ පිළිබඳ ව විමසීමක් කරන්න.

7. දේශීය ජන නාට්‍ය අතර සොකරි හා කෝළම් විශේෂ තැනක් ගනී.

(i) සොකරි නාටකයට අයත් කවියක් ලියන්න.

(ii) ඉහත ජන නාටකවලට අයත් චරිත **දෙක** බැගින් හඳුන්වා දෙන්න.

(iii) සොකරි හා කෝළම්වල දී දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ ව විමසීමක් කරන්න.

* * *